# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1911/15 - 2015 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා - 2015.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (xiv).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 වැනි වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වන වගන්තියේ (4) වන උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍ය සරත් අමුණුගම වන මා විසින්, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විශ්වවිද්‍යාලයේ බලධාරීන් විසින් එම ත්‍රිකුණාමලය මණ්ඩපයේ කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට අපොහොසත් ව ඇති බවට ද සෑහීමකට පත් වීමෙන් පසු එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපයේ මණ්ඩපාධිපති වෙත පරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී මණ්ඩපාධිපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා, 2015 අප්‍රේල් මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නියමය මගින් පත් කරමි.

සරත් අමුණුගම,
උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍ය.

2015 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ දී ය.

05 - 166



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*